# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,976 — 1933ක්වූ අප්‍රේල් මස 12 වෙනි දිනවූ බදාදා.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ ආඥාපනත.

1920ෙස් අංක 11 දරන පළාත් ආණ්ඩුසභා සම්බන්ධ අංක 25 දරණ ආඥාපණතෙන් 245 යන වගන්තිය හා බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901ෙක් අංක 25 දරණ ආඥාපණතේ 5වෙනි, 6වෙනි වගන්ති යටතෙහි අම්බලන්ගොඩ නගරබද ප්‍රදේශ සභාව විසින් සම්පාදනයකරනලද උපනීති.

ඊ. සී. පී. ප්‍රනාන්දු,
නගරබද ප්‍රදේශ සභාවේ සභාපතිතැන.

1933ක්වූ අප්‍රේල් මස 10වෙනි දින
අම්බලන්ගොඩදීය.

#### උපනීති.

1. අම්බලන්ගොඩ නගරබද ප්‍රදේශසභාවට අයත් සීමාව තුළ තබාගෙන සිටින සෑම බල්ලා නොහොත් බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා එසේ නැත්නම් අයිතිකාරව ඉන්නා අය විසින් රුපියල් 1ක් බල්ලන් ලියාපදිංචිකිරීම සඳහා අවුරුදු පතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුය. මේ ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණින්නලබන්නේ එක් අවුරුද්දක අප්‍රේල් මාසයේ 1වෙනිදා සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිදා වනතුරුය.

2. ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා නගරබද ප්‍රදේශසභාවේ සභාපතිතැන විසින් පත්කොට සිටින (මෙහි මින්මතු අයකරු යනුවෙන් හඳුන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මාසේ 31වෙනිදට මත්තෙන් නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට ඇතුළත් අවට භූමියෙහි හෝ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලිය සම්බන්ධව විස්තර කරුණු මීට යාකොට තිබෙන A ඇතුළත් පත්‍රයෙහි වුවමනාකරන පරිද්දෙන් සපයාදිය යුතුයි.

3. යටකී අයකරුට හෝ නගරබද ප්‍රදේශසභාවේ ලේකම් තැනට හෝ නියමිත අයමුදල ගෙවූවිට B ඇතුළත් පත්‍රයෙහිවූ පරිද්දෙන් ලියාපදිංචිකළ බවට සහතිකයක් දෙනුලැබේ.

4. (1) යම් බල්ලෙක් හෝ බැල්ලියක් හෝ ඉදින් :—

(a) අනිත් බල්ලාටද බෝවියහැක්කේයයි අයකරු හෝ ලේකම්තැන කල්පනාකරන ප්‍රමාණයකට රෝගයක් පෙළේ නම් හෝ :

(b) වයස, ලෙඩ, තුවාල යන මෙයින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටින්ට සුදුසුනැතැයි තමන්ට කල්පනාවේනම්, එබඳු බල්ලකු හෝ බැල්ලියක් සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරු හෝ ලේකම් තැනට පුළුවන, නැත්නම්:

(2) ලේකම්තැන හෝ අයකරු මැනවයි සලකන කොයිම නියමයකට හමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටහත්කිරීම ගැන නොසතුටුවූ බල්ලන් අයිතිකාරයකුට ඊට විරුද්ධව නගරබද ප්‍රදේශසභාවේ සභාපතිතැන වෙත පැමිණිලිකර සිටින්නට පුළුවන. එවිට එසේ නොදී හැරීම හෝ නියමයන්ට යටහත්කිරීම ස්ථිරකරන්නට හෝ මදක් වෙනස් කරන්නට හෝ අවලංගුකරන්නට හෝ සභාපතිතැනට පුළුවන.

5. ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයකම පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, එනම් :—

(a) සභාපතිතැනගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අඳුමට බල්ලා තුවාලව හෝ රෝගාතුරව සිටිනම් එක්කෝ,

(b) ඒ බල්ලාගේ අයිතිකාරයා ඌට නිතිපතා හිරිහැර කරන බව හෝ ඌ ගැන සොයා නොබලන බව හෝ සභාපතිතැනට ඒත්තුගියේනම් එක්කෝ,

(c) ඒ බල්ලා බෝවෙන හෝ පැතිරයන ලෙඩකින් පෙළෙමින් සිටියදී අනුන්ට අයිති වෙනින් බල්ලන් හා එකට ගැවසෙන්නට ඌ අයිතිකාරයා විසින් ඉඩ හැරියේනම් මේ සහතිකය අවලංගුකරන්නට අම්බලන්ගොඩ නගරබද ප්‍රදේශ සභාවේ සභාපතිතැනට පුළුවන.

6. සහතිකයක් දෙන්නට බැරිය කියනුලැබ හෝ දෙනලද සහතිකයක් නියමයන් අනුව ක්‍රියා නොකිරීම හේතුකොට ගෙණ එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලකු හෝ බැල්ලියක් රැකබලාගෙන ඉන්නෙක් හෝ අයිතිකාරයෙක් හෝ වීනම් ඔහු විසින් නගරබද ප්‍රදේශසභාවෙන් ඒ සඳහා දැන්වීමක් ලත්විට එහි සඳහන් වේලාවට නගරබද ප්‍රදේශසභාවේ කන්තෝරුවට ඒ බල්ලා හෝ බැල්ලී ගෙණගොස් උන් බාරගන්ට බලය ලබා සිටින නගරබද ප්‍රදේශසභාවේ නිලධාරියකුට බාර දියයුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව සභාපතිතැන නියම් කරන පරිද්දෙන් ක්‍රියාකරනු ලැබේ.

## A.—ආකෘති පත්‍රයයි.

**බල්ලන් සම්බන්ධව උපනීතිවල නියමිත ලේඛනයයි.**

**ගෙදර අංකය :——**

**වීදිය :——**

**ගෙහිමියාගේ නම :——**

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන. | විස්තර. | | | | | | අයිතිකාරයාගේ නම. | ගාස්තුව ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගෑනු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශෙෂ ලකුණු. | වෙනිවූ කරුණු. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිදා හෝ ඊට පෙර |

ආකෘති පත්‍රය බාරදුන් දවස :——.

——————,
ගෙහිමියාගේ අත්සන.

19 —— දින අම්බලන්ගොඩදීය.

ඉහත සඳහන් ගෙහිමියා විසින් ඉහත සඳහන් භැඹුල්පත්‍රය පුරවා සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් වීනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

සභාපතිතුමාගේ අණ පරිදි,

——————,
ලේකම්.

19 —— දින අම්බලන්ගොඩ නගරබද ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

---

## B.—ආකෘති පත්‍රය.

**බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.**

**ලියාපදිංචිකිරීමේ අංකය : —— අංක ——**

**වීදිය : ——.**

**දරණ නම :**

ගෘහයෙහි වාසයකරණ ——————, විසින් පහත සඳහන් විස්තර ඇති බල්ලෙකු/බැල්ලියක් මේ කන්තෝරුවෙහි ලියාපදිංචිකළ බවද, ඊට නියම ගාස්තුවවූ රුපියල් එකක් ගෙවූ බවද මෙසින් සහතිකකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර :——.

ජාතිය : ——.

පිරිමි සතාද ගෑනු සතාද යන වග : ——.

පාට : ——.

බෙල්ලේ මහත : ——.

විශෙෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිදා වනතුරු බල සහිතව පැවතේ.

——————,
ලේකම්.

වර්ෂ 19 —— ක්වූ —— වෙනි දින අම්බලන්ගොඩ නාගරික ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

---

**බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ ආඥාපණත.**

බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ අංක 25 දරන ආඥාපණතේ 5වෙනි, 6වෙනි යන වගන්ති සහ 1920සේ අංක 11 දරන පළාත් ආණ්ඩු සභා සම්බන්ධ ආඥාපණතේ 245වෙනි වගන්ති යටතෙහි වැලිගම නගරබද පළාත් ආණ්ඩු සභාව විසින් සම්පාදනයකරනලද උපනීතියි.

ජේම්ස් සමරවීර,
වැලිගම නගරබද පලාත් ආණ්ඩු සභාවේ ප්‍රධානතැන වම්ස.

වර්ෂ 1933ක්වූ අප්‍රේල් මස 5වෙනි දින වැලිගම නගරබද පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

## උපනීති.

1\. වැලිගම නගරබද පළාත් ආණ්ඩු සභාවට අයිති සීමා තුළ තබාගෙන සිටින සෑම බල්ලා හෝ බැල්ලී හෝ ගැන ඒ සතා රැකබලාගන්නා නොහොත් අයිතිකාරව ඉන්නා අය විසින් බල්ලෙකුට රු. 1 බැගින්ද, බැල්ලියකුට රු. 1·50 බැගින්ද, බල්ලන් ලියාපදිංචිකිරීම සඳහා අවුරුද්දපතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුය. මෙම ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණිනු ලබන්නේ එක් අවුරුද්දක අප්‍රේල් මස 1වෙනිදා සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිදා වනතුරුය.

2\. ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා නගරබද පළාත් ආණ්ඩු සභාවේ ප්‍රධානතැන විසින් පත්කර සිටින (මෙහි මින්මතු අයකරු යන්නෙන් හඳුන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මස 31වෙනිදාට ප්‍රථම නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නෙකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට අයිති අවට භූමියෙහි හෝ තබාගෙන සිටින එක් බල්ලා හෝ බැල්ලිය හෝ සම්බන්ධව විස්තර කරණු මීට යාකොට තිබෙන A අක්ෂරය දරණ ආකෘතිපත්‍රයෙහි වුවමනා කරණ පරිද්දෙන් සපයාදිය යුතුයි.

3\. ඉහතකී අයකරුට හෝ නගරබද පළාත් ආණ්ඩු සභාවේ ලේකම්තැනට හෝ නියමිත අය මුදල ගෙවූවිට B අක්ෂරය දරණ ආකෘතිපත්‍රයෙහිවූ පරිද්දෙන් ලියාපදිංචිකර බවට සහතිකයක් දෙනුලැබේ.

4\. (1) යම් බල්ලෙක් හෝ බැල්ලියක් හෝ ඉදින් :—

(*a*) අනිත් බල්ලන්වද බෝවිය හැක්කේයයි අයකරු හෝ ලේකම්තැන හෝ කල්පනාකරණ ප්‍රමාණයකට රෝගයකින් පෙළේනම් හෝ,

(*b*) වයස, ලෙඩ, තුවාල යන මේසින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටින්ට සුදුසු නැතැයි තමන්ට කල්පනාවේනම් හෝ එබඳු බල්ලෙකුගේ හෝ බැල්ලියකු හෝ සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරු හෝ ලේකම්තැනට හෝ පුළුවන, නැතහොත් :—

(2) ලේකම්තැන හෝ අයකරු හෝ මැනවයි සලකන කොයිම නියමයකට නමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටත්කිරීම ගැන හෝ නොසතුටුවූ බල්ලන් අයිතිකාරයකුට ඊට විරුද්ධව නගරබද පලාත් ආණ්ඩුසභාවේ ප්‍රධානතැන වෙත පැමිණිලිකර සිටින්නට පුළුවන. එවිට එසේ නොදී හැරීම හෝ නියමයන්ට යටත්කිරීම ස්ථිරකරන්නට හෝ මදක් වෙනස්කරන්නට හෝ අවලංගුකරන්නට හෝ ප්‍රධානතැනට පුළුවන.

5\. ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයකට පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, ඒනම් :—

(*a*) ප්‍රධානතැනගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අන්දමට බල්ලා තුවාලව හෝ රෝගාතුරව හෝ සිටිනම් එක්කෝ,

(*b*) ඒ බල්ලාගේ අයිතිකාරයා ඌට නිතිපතා හිරිහැර කරන බව හෝ ඌ ගැන සොයා නොබලන බව හෝ ප්‍රධානතැනට ඒත්තුයියේනම් එක්කෝ,

(*c*) ඒ බල්ලා බෝවෙන හෝ පැතිරෙන හෝ ලෙඩකින් පෙළෙමෙන් සිටියදී අනුන්ට අයිති වෙනිත් බල්ලන් හා එකට ගැවසෙන්ට ඌ අයිතිකාරයා විසින් ඌට ඉඩහරිනලද්දේ නම්.

මේ සහතිකය අවලංගුකරන්නට නගරබද පළාත් ආණ්ඩු සභාවේ ප්‍රධානතැනට පුළුවන.

6\. සහතිකයක් දෙන්නට බැරියකියනුලැබ හෝ දෙනලද සහතිකය නියමයන් අනුව ක්‍රියානොකිරීම හේතුකොට ගෙන එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලෙකු හෝ බැල්ලියකු හෝ රැකබලාගෙන ඉන්නෙක් හෝ අයිතිකාරයෙක් හෝ වීනම් ඔහු විසින් නගරබද පළාත් ආණ්ඩුසභා කාර්යාලයට ඒ බල්ලා හෝ බැල්ලී හෝ ගෙනගොස් ඌ භාරගන්ට බලය ලබාසිටින නගරබද පළාත් ආණ්ඩු සභාවේ නිලධාරියෙකුට භාරදිය යුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව ප්‍රධානතැන නියමකරන පරිද්දෙන් ක්‍රියාකරණු ලැබේ.

1901කේ අංක 25 දරණ බල්ලන් ලියා පදිංචිකිරීමේ ආඥාපණත යටතේ මාතර සනීපාරක්ෂක සභාව විසින් සම්පාදිතව, වර්ෂ 1924ක්වූ මැයි මස 2වෙනි දින නිකුත්කරනලද අංක 7,390 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පලවූ වර්ෂ 1924ක්වූ අප්‍රේල් මස 28වෙනි දින දරන උපනීති මෙසින් අවලංගු කරණු ලැබේ.

### A.—ආකෘති පත්‍රයයි.

**බල්ලන් සම්බන්ධ උපනීතිවල නියමිත ලේඛනයයි.**

ගෙදර අංකය : ——.
වීදිය : ——.
ගෙහිමියාගේ නම : ——.

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන. | විස්තර. | | | | | | අයිතිකාරයාගේ නම. | ගාස්තු ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගෑනු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශේෂ ලකුණු. | බැඳීම් කාරණා. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිදා හෝ ඊට පෙර. |

ආකෘති පත්‍රය බාරදුන් දවස : ——.

——————
ගෙහිමියාගේ අත්සන.

19 —— දින වැලිගමදීය.

ඉහත සඳහන් ගෙහිමියා විසින් ඉහත සඳහන් හැඩනල්පත්‍රය පූරවා සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් විනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

ප්‍රධානතැනගේ අණප්‍රකාර,

——————,
ලේකම්.

19 —— දින වැලිගම නගරබද
පළාත් ආණ්ඩුසභා කාර්‍යසීලයේදීය.

### B.—ආකෘති පත්‍රයයි.

**බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.**

වීදිය : ——. ලියාපදිංචිකිරීමේ අංකය : —— දරණ නම ගෘහ යෙහි වාසයකරණ ————, විසින් පහත සඳහන් විස්තර ඇති බල්ලෙකු/බැල්ලියෙක් මේ කාර්‍යසීලයෙහි ලියාපදිංචි කළබවද, ඊට නියම ගාස්තුවවූ රුපියල් ———— ගෙවූ බවද මෙසින් සහතිකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර.

ජාතිය : ——.

පිරිමි සතාද ගෑනු සතාද යන වග : ——.

පාට : ——.

බෙල්ලේ මහත : ——.

විශෙෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිදා වනතුරු බල සහිතව පැවතේ.

——————,
ලේකම්.

වර්ෂ 19 —— ක්වූ —— වෙනි දින වැලිගම නගරබද
පළාත් ආණ්ඩු කාර්‍යසීලයේදීය.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට ඒ නම්:—පෝරේ මිනීපිට්ටනිය විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A. 45. ගම—පෝරේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තුඹුවෙවත්ත | පොල්ගස් 1ක්ද, දෙල්ගස් 2ක් සහ පාරක කොට සකින් යුත් ඉඩම | ඩබ්ලිව්. චාර්ලිස් පෙරේරා, ඩබ්ලිව්. සේතුහාමි, ඩබ්ලිව්. විලියම් පෙරේරා, ඕ. සයිමන් පෙරේරා, බී. ජෝන්අප්පු, ඞී. ඈම්. සයිමන් පෙරේරා, එච්. පබිලිස් පෙරේරා, සියලුදෙනාම පෝරේ පදිංචි සහ නැසීගිය ඒ ජේමානිස් පෙරේරාගේ උරුමක්කාරයෝ සහ නෑදෑයින් සමහර දෙනෙක් ඔවුන්ගේ නම් සහ පදිංචි ස්ථාන දැනගන්ට නැත | 0 1 2·9 |
| 2 | දෙල්ගහවත්ත .. | කහටගහකින් යුත් ඉඩම | ජී. පබිලිස්අප්පු, ජී. බබාහාමි, ජී. පොඩිසිඤ්ඤො, ජී. දුලිහාමි, ජී. බබිනෝනා, ජී. ඩාවිත්, ජී. ලැසිසානෝනා, ජී. හෙන්රිස්, ඩබ්ලිව්. පොඩිසිඤ්ඤො පෙරේරා, ඩබ්ලිව්. සයිමන් පෙරේරා, ඩබ්ලිව්. ජේම්ස් පෙරේරා, ඩබ්ලිව්. තෝමිස් පෙරේරා, ඩබ්ලිව්. පොඩිනෝනා පෙරේරා, ඇස්. ඊවින් සිඤ්ඤො, බී. ජෝන්අප්පු, ඩබ්ලිව්. විලියම් පෙරේරා, ඩබ්ලිව්. සුරබිහෙල්, ඞී. ඈම්. සිම්යන් පෙරේරා සහ ඕ. සයිමන් පෙරේරා, සියලුදෙනාම පෝරේ පදිංචි | 0 1 25·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ මැයි මස 26වෙනි දින පෙරවරු 10ගේ කහිසඹට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ අප්‍රේල් මස 8වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඒ. ජී. රණසිංහ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වර්‍යා.

——————

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ 7වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—එගොඩවත්තේ වැසිකිලියකට සහ ඊට පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 19. ගම—අලුත්වෙලගම බදුල්ලේ පලාත් නගරසභාවේ සීමාවතුල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙරකඩකුඹුර (වරිපනම් නො. 1280) | කුඹුර .. | නැසීගිය පැලියගොඩකංකානමලාගේ සෙලෝහාමිගේ බූදලයට උරුමකියන අය | 0 0 2·3 |
| 2 | එම .. | එම .. | එම .. .. .. | 0 0 3·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ මැයි මස 20වෙනි දින පෙරවරු 10ගේ කහිසඹට බදුළු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ අප්‍රේල් මස 7වෙනි දින
බදුළු කච්චේරියේදීය.

ඒ. ඊ. මිලින්ටන්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වර්‍යා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.